# ප්ලාස්ටික් ජල බෝතල් මගින් සිදුවන පාරිසරික බලපෑම පිළිබඳව සිදු කරන විමර්ශණාත්මක අධ්‍යනයක් (අනුරාධපුර පූජා නගරය ආශ්‍රිත ප්‍රදේශය ඇසුරෙන්)

*එච්.එස්.සංදීප්* [1]

ප්ලාස්ටික් ජල බෝතල් භාවිතය හා ඒවා අවිධිමත් අයුරින් බැහැර කිරීම ශ්‍රී ලංකාව තුළ බහුලව දැකිය හැකිය. කලාපයක් ලෙස ගත් විට අනුරාධපුර පූජා නගරය ආශ්‍රිතව මෙම තත්වය වැඩි වශයෙන් සිදු වී ඇති ආකාරය මෙම පර්යේෂණය මගින් පෙනී යන්නකි. මෙම පර්යේෂණය තුළ දත්ත විශ්ලේෂණයේදී පානීය ජල බෝතල් භාවිතයෙන් පරිසරයට හා ප්‍රජාවට සිදු වන හානිය කොතෙක්ද? යන්න සම්බන්ධයෙන් කරුණු ගණනාවක් අනාවරණය කර ගැනීමට හැකි විය.බෝතල් කළ පානීය ජලය යනු අනාගතයේ නව රැල්ලක් වන අතර එය සමාජයට,පරිසරයට හා සංස්කෘතියට සිදුවන හානිය නොසලකා හරිමින් මිලියන සංඛ්‍යාත ජනතාවක් දිනපතා මිලදී ගෙන පරිභෝජනය කරනු ලබයි. ඒ නිසාවෙන් ප්ලාස්ටික් ජල බෝතල් භාවිතය වැඩි වී කසල කළමණාකරණය ආශ්‍රිත නව ගැටලු රාශියක් නිර්මාණය වී ඇත. අනුරාධපුර පූජා භූමිය ආශ්‍රිත ප්‍රදේශයන්හී මාර්ගයන් අවට හා ජල මූලාශ්‍ර ආශ්‍රිතව ඉවතලන ප්ලාස්ටික් ජල බෝතල් විශාල සංඛ්‍යාවක් දැකිය හැකිය.ප්ලාස්ටික් ජල බෝතල් ඉවතලීම මගින් අනුරාධපුර පූජා භූමිය අවට ප්‍රදේශයට අත් වී ඇති විනාශය පිළිබඳව සොයා බැලීම මෙහි අරමුණ වේ.මේ සඳහා මා විසින් යොදා ගනු ලැබුවේ ගුණාත්මක දත්ත පර්යේෂණ ක්‍රමයයි.ඒ අනුව ද්විතීක මූලාශ්‍ර වශයෙන් පොත්පත්,පුවත්පත්,සගරා යොදා ගත් අතර පුස්තකාලද පරිශීලනය සඳහා යොදා ගන්නා ලදී. මෙම ප්‍රදේශය ඇසුරින් ලබා ගත් තොරතුරු මත පදනම් ව ප්ලාස්ටික ජල බෝතල් බැහැර කිරීම මගින් ඒ අවට ජල මූලාශ්‍රයන් රාශියක් තුළ විශාල වශයෙන් ගොඩගැසී ඇත. නුවර වැව,තිසා වැව,කුඹිච්චම්කුලම වැව,බසවක්කුලම වැව යනාදී ජල මූලාශ්‍රයන් තුළ ප්ලාස්ටික් ජල බෝතල් එක් වී ඇති ආකාරය දැකිය හැකිය.ඒවායේ ජෛව විවිධත්වය විනාශ වී ඇති අතර දෛනිකව විශාල මසුන් ප්‍රමාණයක් මිය යයි. එම ප්‍රදේශයේ ධීවර කරයුතු වල නියුතු ධීවරයින් පවසන්නේ ඇතැම් මසුන්ගේ ශරීර තුළ ප්ලාස්ටික් බෝතල් කොටස් පැවති බවයි. පුලියන්කුලම ග්‍රාමය තුළ අද වන විට චර්ම රෝග ව්‍යාප්තියක් පෙන්නුම් කරනු ලබයි. වෛද්‍යවරුන්ගේ ඇතැම් මතයන් වන්නේද මෙම රෝගය පසුපස ජලය අපවිත්‍ර වීම හා ජලයේ ගුණාත්මකභාවය අඩු වීම හේතු වන බවයි. මක් නිසාද මෙම ග්‍රාමය ආසන්නයේ නුවර වැව පිහිටා තිබීම හා එහි ජලය විනාශ වී තිබීම බලපා ඇත . ප්ලාස්ටික් ජල බෝතල් කාලයක් තිස්සේ ජලය තුළ තිබීම හා හිරු එළියට නිරාවරණය වීම හේතුවෙන් ටෙරෙෆ්තලේට් නම් රසායනයක් නිර්මාණය වේ. මෙම රසායනය චර්ම රෝග නිර්මාණය වීමට හා වකුගඩු රෝග වර්ධනයට මුල් වේ. කුබිච්චම්කුලම වැව අවට ප්‍රදේශය ගත් විට කාණු සියල්ලම ප්ලාස්ටික් ජල බෝතල් නිසාවෙන් අවහිර වී ඇත. වර්ෂා කාලවලදී කාණු පද්ධතිය අවහිර වී අනුරාධපුර නගරය තුළ ජලය එක් රැස් වීම සිදු වන අතර නිවාස අශ්‍රිත ජල මූලශ්‍රයන් වෙතට මෙම ජලය කාන්දු වීම මගින් පාචනය,කොළරාව වැනි රෝග වාර්තා වීම වැඩි වී ඇත. විශාලම ගැටලුව වන්නේ මෙකී වැව් ආශ්‍රිතව ගැවසෙන වන සතුන් මෙම ප්ලාස්ටික් බෝතල් ආහාරයට ගැනීම මගින් මිය යයි. මාගේ පෞද්ගලික නිගමනය වන්නේ ප්ලාස්ටික් පානීය ජල බෝතල් භාවිතා කොට පරිසරයට අවිධිමත් ලෙස බැහැර කිරීම විශාල හානි රැසකට මුලිකත්වය ගන්නා බවයි. මේ සඳහා භාවිතා කළ හැකි නව යෝජනාවන් ලෙස අනුරාධපුර පූජා නගරය ආශ්‍රිතව කසළ කළමණාකරණ පිළිවෙත් අනුගමනය කළ හැකිය.මීට අමතරව වැව් අශ්‍රිතව කසල බඳුන් ස්ථාපිත කොට දෛනිකව ඒවාට එකතු වන ප්ලාස්ටික් බෝතල් නැවත ප්‍රතිචක්‍රීකරණය සඳහා අදාළ පාර්ශවයන්ට ලබා දිය යුතුය. පවතින නීතී යාවත්කාලීන කොට අවිධිමත් ලෙස කසල බැහැර කරන්නන්ට එරෙහිව දැඩි දඬුවම් පැනවීමද උචිත වේ.

**ප්‍රමුඛ පද** - *පානීය ජලය, බෝතල්, චර්ම, ප්‍රතිචක්‍රීකරණය, ටෙරෙෆ්තලේට්*

---

[1] පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. hssandeep08@gmail.com